# මහජනතාවට දැනුම් දීමයි!



**IBSL**
INSURANCE BOARD
OF SRI LANKA

## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

(මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය)

# රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් රක්ෂණාවරණයක් ලබාගන්නේ නම්...

වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි වූ රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරැව්කාර සමාගම් විසින් පුද්ගලයින් රක්ෂණ නියෝජිතයින් ලෙස ලියාපදිංචි කර ගැනීම සඳහා අවසර දී ඇත.

රක්ෂණ නියෝජිතයෙකු ලෙස ලියාපදිංචිය සඳහා ඇතුලත්වීමට අවම වශයෙන් තිබිය යුතු අධ්‍යාපනික සහ අනෙකුත් සුදුසුකම් පිළිබඳව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පැහැදිලි කර තිබේ. තවද ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය මඟින් පවත්වන පූර්ව අනුයුක්තතා විභාගය සමත්වීම ද අවශ්‍ය වේ.

රක්ෂණ නියෝජිතයින් වශයෙන් ලියාපදිංචි වීම සඳහා බලාපොරොත්තු වන පුද්ගලයින්ගේ යෝග්‍යතාවය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය පත්කොට ඇත. ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය විසින් ඒ සඳහා පිළිගත් ක්‍රමවේදයන් හා පිළිවෙත් හඳුන්වා දී තිබේ.

රක්ෂණ අලෙවි ප්‍රවර්ධනයේ යෙදෙන සෑම නියෝජිතයෙකු විසින්ම ඔහුට/ඇයට අදාල රක්ෂණ සමාගමෙන් හෝ රක්ෂණ තැරැව්කාර සමාගමෙන් නිකුත්කොට ඇති හැඳුනුම්පත රැගෙන යා යුතුවේ. මෙම හැඳුනුම්පතේ එම නියෝජිතයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හෝ ගුවන් ගමන් බලපත් අංකය, නියෝජිතයා ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම හෝ රක්ෂණ තැරැව්කාර සමාගමේ නම, බලයලත් නිලධාරියෙකුගේ අත්සන සහ නියෝජිත අංකය යනාදී තොරතුරු සඳහන් විය යුතුවේ.

රක්ෂණ නියෝජිතයෙකු සමඟ රක්ෂණ කටයුතු කරන මහජනයා හට එම රක්ෂණ නියෝජිතයාගේ අනන්‍යතාවය පරීක්ෂා කිරීමට අයිතියක් ඇත. මේ පිළිබඳ වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය නම් අදාල නියෝජිතයා අයත්වන රක්ෂණ සමාගම හෝ රක්ෂණ තැරැව්කාර සමාගම අමතන්න.

රක්ෂණ යෝජනා පත්‍රය පිරවීමේදී හා අත්සන් කිරීමට පෙර අදාල සත්‍ය හා නිවැරදි තොරතුරු ඇතුලත්ව තිබේදැයි සහ තමන්ට අවශ්‍ය රක්ෂණ ආවරණය ලැබී තිබේදැයි ද පරීක්ෂා කරන්න.


අධ්‍යක්ෂ ජනරාල්

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**

11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1.

දුරකථන: 011 2396184-9 ෆැක්ස්: 011 2396190

ඊ මේල්: info@ibsl.gov.lk වෙබ් අඩවිය: www.ibsl.gov.lk